# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,387—1962 නොවැම්බර් 9 වැනි සිකුරාද—1962.11.9**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1539 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1540 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1540 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1541 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |

| | පිට |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1543 |
| මිල පාලනු දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලඞකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1549 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 449

අංකය : ඞී 31/රෙක් ව.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1960 ජනවාරි 12 දින සිට මේජර් (උපකරණ පාලක) වශයෙන් :—

කපිතාන් (උපකරණ පාලක) සුප්‍රමානියම් ධර්මරත්නම්, ල.යු.සේ.බ.

ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කර ඇති දින සිට තාවකාලික මේජර්වරු වශයෙන් :—

කපිතාන් සෝමවීර ඩෙනිස්ටන් නානායක්කාර හපුගල, ල.ස.ස.බ.—1960 ඔක්තෝබර් 1 දින සිට.

කපිතාන් සුගතපාල සිරිල් රණතුංග, ල.ස.ස.බ.—1960 ඔක්තෝබර් 1 දින සිට.

කපිතාන් ක්ලැරන්ස් ඔස්කාර් පුනාන්ඩර්, ල.යු.වෛ.බ.—1961 දෙසැම්බර් 7 දින සිට.

ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කර ඇති දින සිට තාවකාලික කපිතාන්වරු වශයෙන් :—

ලුතිනන් නොලැස්කො එවරිස්ටස් රැන්ස්පඩ් මාටින්, ල.ඉ.—1960 ඔක්තෝබර් 21 දින සිට.

ලුතිනන් බර්ට්‍රම් එඩ්වඩ් දේවේන්ද්‍ර විජේන්ද්‍ර ල.කා.හ.—1961 අප්‍රේල් 1 දින සිට.

ලුතිනන් ජෝසප් ඇෂ්ටන් අර්නස්ට් කැස්පර්ස්, ල. ඉ.—1961 අප්‍රේල් 1 දින සිට.

ලුතිනන් ලොකුලියනගේ ක්ලෙමන්ට් ජෝන් කබ්රාල්, ල.ඉ.—1961 අප්‍රේල් 1 දින සිට.

ලුතිනන් ලියනගේ ගුණසෝම සිගේරා, ල.යු.යු.බ.—1961 මැයි 1 දින සිට.

ලුතිනන් ෂර්ලි වික්‍රමසිංහ ජයසේකර, ල.යු.යු.බ.—1961 ඔක්තෝබර් 1 දින සිට.

ලුතිනන් මුතමෙරෙන්න හොවර්ඩ් ධර්මසිරි, ල.යු.යු.බ.—1961 දෙසැම්බර් 3 දින සිට.

ලුතිනන් ඩාර්න්ලි ස්ටැනිස්ලෝස් ද සූසා, ල.සි.රෙ.—1962 අප්‍රේල් 1 දින සිට.

ලුතිනන් සින්නතම්බි ආනන්තසුන්දරම්, ල.පා.හ.—1962 මැයි 2 දින සිට.

ලුතිනන් ඩග්ලස් ලින්සේ විජේසිංහ ල.ඉ.—1962 මැයි 8 දින සිට.

ලුතිනන් ගුස්තිනා වඩු උපසිරි, ල.යු.පොසේ.බ.—1962 ජූලි 2 දින සිට.

ලුතිනන් ක්වින්ටස් චන්ද්‍රා බටුවිටගේ, ල.යු. සේ.බ.—1962 ජූලි 6 දින සිට.

ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කර ඇති දින සිට ලුතිනන්වරු වශයෙන් :—

උප ලුතිනන් සෙබස්තියන්පිල්ලෙයි ඥානප්‍රගාසම්, ල.පා.හ.—1962 මාර්තු 23 දින සිට.

උප ලුතිනන් පෙස්තේරුවෙලියනරාලලාගේ පීටර් කැමිලස් ක්‍රිස්ටෝපර් කුරේ, ල.සි.රෙ.—1962 ජූනි 13 දින සිට.

උප ලුතිනන් නන්දදාස පේමසිරි නාගසිංහ, ල.ඉ.—1962 ජූනි 13 දින සිට.

උප ලුතිනන් ලාලිත් තිරත් ප්‍රනාන්දු, ල.සි.රෙ.—1962 ජූනි 15 දින සිට.

උප ලුතිනන් බැස්තියම්පිල්ලෙයි අයිවෝර් නොවෙලෝ, ල.කා.හ.—1962 ජූනි 15 දින සිට.

උප ලුතිනන් සේන පාලිත ද සිල්වා, ල.පා.හ.—1962 ජූනි 15 දින සිට.

උප ලුතිනන් කෝදාගොඩ විතානගේ ප්‍රේමනන්ද ගුණරත්න, ල.කා.හ.—1962 ජූනි 15 දින සිට.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ක්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් 2? වෙනිදා,
කොළඹ දීය.

14-3??

1962 අංක 450

රා. ආ. වි. අ.—අංකය : ඞී. 39/ඒ/සීඊආර්.

අංක 8,029 හා 1934 ජනවාරි 26 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි අනුව, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ, යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බල සේනාවේ පහත නම් සඳහන් නිලධාරීනට කාර්යක්ෂමතා සැරසිල්ල (ලංකා) ප්‍රදානය කර තිබේ.

ස්වදේශාරක්ෂක රෙජිමේන්තුව

කපිතාන් ගොඩ්ෆ්‍රි ආතර් ක්‍රිස්ටියන්ස්.

ලංකා යුද හමුදා පුරෝගාමී බලකාය

971 කපිතාන් මහ අමරසිංහගේ ජෝසප් ද අල්විස්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෘ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 ඔක්තෝබර් 22 වෙනිදා,
කොළඹ දීය.

11-320

---

1962 අංක 451

රා. ආ. වි. අ.—අංකය : ඞී. 39/බී/සීඊආර්.

අංක 8,029 හා 1934 ජනවාරි මස 26 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි අනුව, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ, යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බල් සේනාවේ පහත නම් සඳහන් අයට කාර්යක්ෂම පදක්කම් (ලංකා) හා/හෝ එයට සන්ධාරයන් ප්‍රදානය කර තිබේ :—

ලංකා යුද හමුදා බලකාය (ස්වේඡා)

කාර්යක්ෂමතා පදක්කම

1402 ලුතිනන් (උපකරණ පාලක) එරික් තියඩෝසියස් ද අල්විස්.
919 මාණ්ඩලික සැරයන් ප්‍රනාන්දු, නන්දිකාරගේ රිචඩ්.

1 වෙනි සන්ධාරය

727 ක්ණ්ඩායම් සාජන්ට් මේජර් ජයතිලක, විල්ප්‍රඩ්

2 වෙනි (ස්වේච්ඡා) කණ්ඩායම, ලංකා යුද හමුදා සේවා බලකාය

කාර්යක්ෂමතා පදක්කම

3014 කෝප්‍රල් වැන් එස්ටොප් ක්ලිපර්ඩ් හියුගෝ සෙන්ට් ක්ලෙයාර්.

3032 බ. නි. 11 විජේසිංහ, කිරිබණ්ඩාර.

2 වෙනි (ස්වේච්ඡා) බලඇණිය, ලංකා සිංහ රෙජිමේන්තුව

පළමු වන හා දෙවන සන්ධාරයන්

8 කොඩි සැරයන් මල්ගම්මන, සිරිල් රූපට් බර්ට්රම්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෘ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 ඔක්තෝබර් 22 වෙනිදා,
කොළඹ දී ය.

11-322

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 452

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කරනු ලෙස නියම කර ඇත්තේ ය :—

ඒ. 237/62.

1962 අගෝස්තු මස 1 වැනි දින සිට 1962 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා සිවිල් සේවක ඒ. ඕ. වීරසිංහ මහතා අතිරේක සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (පාලන) වශයෙන් වැඩ බැලීමට.

ඒ. 57/59.

සිවිල් සේවක බී. ආර්. දේවරාජන් මහතා 1962 ජූනි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ලුණු කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 299/62.

1962 සැප්තැම්බර් මස 8 වැනි දින සිට 1962 සැප්තැම්බර් මස 22 වැනි දින දක්වා කාලය තුළ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, සහකාර ලේකම් සිවිල් සේවක සී. ගමගේ මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව රජයේ දේශ සංචාරක කාර්යාංශයේ අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 113/60.

සිවිල් සේවක වී. පී. ඒ. පෙරේරා මහතා 1962 ජූනි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට එම පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 8/62.

1962 ජූලි මස 14 වැනි දින සිට අධිනීතිඥ වී. සී. ගුණතිලක මහතා ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ වරයෙකු වශයෙන්.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 නොවැම්බර් මස 5 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

11-495

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 453

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 20/48.

එස්. එස්. කුලතිලක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ඔක්තෝබර් මස 25 වැනි දින සිට ගම්පහ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 57,473/ඒ දරණ නඩුවේ තීන්දුව දෙන තෙක් ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 7/53.

මොහමඩ් හුසේන් මහතා 1962 ජූනි මස 22 වැනි දින සිට හෝ නැවත නියමයක් කරන තුරු ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන් පත් කර ඇත.

අංකය : ජේඑම්. 7/53.

ජේ. සේනාධිරාජා මහතා 1962 ජූලි මස 22 වැනි දින සිට හෝ නැවත නියමයක් කරන තුරු ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන් පත් කර ඇත,

අංකය : ජේඑල්. 21. ඒ/56.

ඞී. එච්. ද එස්. ගුණවර්ධන, ඒ. ඞී. ජේ. ගුණවර්ධන සහ එස්. ඞී. ජයසුන්දර යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ටී. බස්නායක මහතා 1962 නොවැම්බර් මස 1 වැනි දින සිට 4 වැනි දින දක්වා ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 6. ඒ/48.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1962 ඔක්තෝබර් මස 31 වැනි දින සිට 1962 නොවැම්බර් මස 4 වැනි දින දක්වා මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 12. ඒ/57.

කේ. සී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 ඔක්තෝබර් මස 29 වැනි දින සිට 1962 නොවැම්බර් මස 2 වැනි දින දක්වා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 12. ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ඕ. රණතුංග මහතා 1962 නොවැම්බර් මස 3 වැනි දින තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ හම්බන්තොට අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. අමරසිංහ මහතා 1962 නොවැම්බර් මස 1 වැනි දින තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ හම්බන්තොට අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 16.ඒ/59.

ඞී. ඊ. ධම්සේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 ඔක්තෝබර් මස 31 වැනි දින සිට 1962 නොවැම්බර් මස 1 වැනි දින දක්වා බලපිටියේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 60/52.

වී. එම්. කුමාරස්වාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබෙයි මහතා 1962 නොවැම්බර් මස 12 වැනි සහ 13 වැනි දිනයන්හි පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පේදුරුතුඩුවේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 60/52.

වී. එම්. කුමාරස්වාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. රත්නසිංහම් මහතා 1962 නොවැම්බර් මස 7 වැනි දින සිට 11 වැනි දින දක්වා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අතිරේක මහේස්ත්‍රාත් සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68. සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 නොවැම්බර් මස 8 වැනි දින සිට 11 වැනි දින දක්වා අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරම සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ ත්‍රිකුණාමලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 1. සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 නොවැම්බර් මස 1 වැනි දින ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 68. සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. පී. සේනාරත්න මහතා 1962 නොවැම්බර් මස 12 වැනි දින සිට 14 වැනි දින දක්වා අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරම සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ ත්‍රිකුණාමලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1962 නොවැම්බර් මස 12 වැනි දින මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ඊ. බී. වැත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 නොවැම්බර් මස 2 වෙනි 7 වෙනි සහ 8 වෙනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ ගිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 6/48.

වී. සෝමසුන්දරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. වී. සේනාධිරාජා මහතා 1962 නොවැම්බර් මස 2 වැනි දින වවුනියා සහ යාපන දිස්ත්‍රික්කවල, උතුරු වවුනියාවේ සහ මුහුදු බඩ පත්තුවල ගම්බද උසාවි සභාපති වශයෙන් සහ පූනකාරි—තුන්නුකායි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 7/56.

ඊ. බී. වැත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමෙනුවෙල් මහතා 1962 නොවැම්බර් මස 10 වෙනි දින සහ 12 වෙනි දින සිට 14 වෙනි දින දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ ගිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පිරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. වික්‍රමතුංග මහතා 1962 ඔක්තෝබර් මස 30 වෙනි සහ 31 වෙනි දිනයන්හි සහ 1962 නොවැම්බර් මස 2 වෙනි දිනද මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා වැලිගම් කෝරළේ හා ගඟබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 1/48.

ඊ. එල්. ජේ. හඩ්ජි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 නොවැම්බර් මස 1 වෙනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිලි හත්පත්තුවේ සහ ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 6/61.

පී. බී. හේරත් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. පී. අබේවික්‍රම මහතා 1962 නොවැම්බර් මස 5 වෙනි දින බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිද හා වැල්ලවායේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඇන්. ඒ. ද එස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 නොවැම්බර් මස 1 වැනි දින,
අධිකරණසේවා කොමිෂන් සභා කායාීලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

11-416

## වෙනත් පත් කිරීම් ආදිය

**1962 අංක 454**

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

අංකය : ඒඅයි. 2/1/62.

1962 ඔක්තෝබර් මස 12 වෙනි දින සිට, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටිකෝරළයේ මත්තේගොඩ, කහතුඩුව පේරුවල හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ජේ. පී. පී. හේමචන්ද්‍ර මහතාද,

අංකය : ඒ.අයි. 9/1/53.

1962 ඔක්තෝබර් මස 18 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු යාපනය දිස්ත්‍රික්කයේ අල්ලායි පිඩි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට එස්. රත්නසභාපති මහතාද,

අංකය : ඒඅයි. 9/9.

1962 ඔක්තෝබර් මස 18 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු යාපනය දිස්ත්‍රික්කයේ යාපනය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට එස්. කනගරත්නම් මහතාද,

අංකය : ඒඅයි. 20/1/61.

1962 ඔක්තෝබර් මස 23 වෙනි දින සිට, ස්ථිර පත්කිරීමක් කරන තුරු රත්නපුර දිස්ත්‍රික්කයේ කෝරලතුන, දෙහිගම්පල් කෝරළේ සහ මාපිටිගම රුවන්වැල්ල ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට ඩබ්ලිව්. සී. සමරසිංහ මහතාද,

අංකය : ඒඅයි. 21/2/61.

1961 ජනවාරි මස 1 වෙනි දින සිට මොනරාගල දිස්ත්‍රික්කයේ බිත්තැන්න පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරණ කාලය තුළ, එම කොට්ඨාශයේ පරීක්ෂකවරයෙකු වශයෙන් ඇස්. ඇම්. පියදාස මහතාද,

අංකය : අයිඑන් කපු/එල්. 6/1/62.

1962 සැප්තැම්බර් මස 20 වෙනි දින සිට එච්. ඒ. ඩී. ධර්මරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරලේ පිටිගල, ඇල්පිටිය සහ ඕපාත යන විද්‍යාන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ජේ. පී. ගුරුසිංහ මහතාද,

අංකය : අයිඑන් කපු/එල්. 9/1/57.

1962 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට කේ. වෛතලිංගම් මහතා නැවත වැඩ භාරගන්නා තුරු යාපනය දිස්ත්‍රික්කයේ කයිට්ස්, අනලායිතිව්, එලුවාතිව් කොට්ඨශයන්හි හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට එන්. සෙල්වදුරෙයි මහතාද,

අංකය : අයිඑන් කපු/එල්. 14/5/62.

1962 ඔක්තෝබර් මස 9 වෙනි දින සිට එච්. ඇම්. හීන්බණ්ඩා මහතා නැවත වැඩ භාරගන්නාතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිකවා ගම්පහ කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ජේ. ඇම්. ඩිංගිරිබණ්ඩා මහතා ද,

අංකය : අයිඑන් කපු/එල්. 18/4/62.

1962 ඔක්තෝබර් මස 23 වෙනි දින සිට ඩබ්ලිව්. බී. හිඟුරුකඩුව මහතා නැවත වැඩ භාරගන්නාතුරු බදුලු දිස්ත්‍රික්කයේ කඳුකර කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට පී. බී. රත්නායක මහතා ද,

අංකය : අයිඑන් කපු/එල්. 21/3/62.

1962 ඔක්තෝබර් මස 3 වෙනි දින සිට කේ. එම්. අබේසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ වැවගම් පත්තු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. තල්ලෙයිනාදන් මහතා ද,

අංකය : ඒ අයි. 9/3/62.

1962 ඔක්තෝබර් මස 18 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු යාපනය දිස්ත්‍රික්කයේ, උරුම්පිරායි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එස්. කනගරත්නම් මහතා ද,

අංකය : ඒ අයි. 3/5/57.

1962 ඔක්තෝබර් මස 16 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු, මහනුවර දිස්ත්‍රික්කයේ පලිස්පත්තුව නැගෙනහිර හා බටහිර කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඒ. බී. ඒකනායක මහතා ද,

අංකය : ඒ අයි. 3/10/62.

1962 ඔක්තෝබර් මස 16 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ ගම්අට පළාත කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට සී. බී. මඩවල මහතා ද,

අංකය : ඒ අයි. 3/2/54.

1962 ඔක්තෝබර් මස 16 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ මැදසිය පත්තුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ජේ. එම්. මොහොට්ටි මහතා ද,

අංකය : ඒ අයි. 3/9/62.

1962 ඔක්තෝබර් මස 16 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ වෙඩරුව කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට අයි. එල්. පුංචිබණ්ඩාර මහතා ද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 2 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-575

---

1962 අංක 455

අංකය : ජේ 79/59.

1944 අංක 13 දරණ ආඥාපනතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9,828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරණ ප්‍රකාශනයෙන් සංශෝධිත 1939 අංක 48 දරණ ළමයින් සහ තරුණ අය පිළිබඳ ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1962 නොවැම්බර් මස 5 වෙනි දින සිට, කේ. සී. ඊ. ද අල්විස් මහතා එම මහතාගේ අනිකුත් රාජකාරිවලට අතිරේක වශයෙන් මඩකලපුව අධිකරණ කොට්ඨාශයෙහි ළමා උසාවි මහෙස්ත්‍රාත්වරයා ලෙසද,

1962 නොවැම්බර් මස 5 වෙනි දින සිට, එස්. ඩී. ජයසුන්දර මහතා එම මහතාගේ අනිකුත් රාජකාරිවලට අතිරේක වශයෙන් තංගල්ල අධිකරණ කොට්ඨාශයෙහි ළමා උසාවි මහෙස්ත්‍රාත්වරයා ලෙසද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 1 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-391

---

1962 අංක 456

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) ඒ. ඩී. ද සිල්වා මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු හා නිලනොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,

(2) එම්. බී. පුස්සැල්ල මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(3) ඩබ්ලිව්. ඒ. බෙනට් සිල්වා මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(4) එච්. එම්. පී. සරත්චන්ද්‍ර මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(5) අයි. එන්. ඩබ්ලිව්. විජේසිංහ මහතා, කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(6) පී. ආර්. නාවරත්න මහතා කෑගලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962.11.5 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-514

---

1962 අංක 457

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගුවේ :—

අංක : 73/1/13 (ඇම් ඇෆ්).

එෆ්. ඩබ්ලිව්. රත්නසාර මහතා, 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට සහ 1962 සැප්තැම්බර් මස 19 වැනි දින සිට කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

අංක : 74/2/210 (ඇම් ඇෆ්).

ඒ. ඒ. රත්නායක මහතා, 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට හම්බන්තොට කච්චේරියට අනුයුක්තව සිටීමට.

ට්. භගවදාස් මහතා 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

අංක : 74/2/641 (ඇම් ඇෆ්).

ට්. භගවදාස් මහතා, 1962 සැප්තැම්බර් මස 24 වැනි දින සිට වවුනියාව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

අංක : 73/1/26 (ඇම් ඇෆ්).

ඒ. ඒ. රත්නායක මහතා, 1962 සැප්තැම්බර් මස 27 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මොනරාගල පාලන දිස්ත්‍රික්කයේ භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/210 (ඇම් ඇෆ්).

ඩබ්ලිව්. බී. සී. සෙනරත්-නන්දදේව මහතා 1962 ඔක්තෝබර් මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට

අංක : 74/2/72 (ඇම් ඇෆ්).

ඩබ්ලිව්. එම්. කරුණාරත්න මහතා, 1962 ඔක්තෝබර් මස 5 වැනි දින සිට නියෝජ්‍ය ආගමන හා විගමන පාලක වශයෙන් වැඩ බැලීමට.

අංක : 74/2/133 (ඇම් ඇෆ්ජ්).

සී. ගමගේ මහතා, 1962 ඔක්තෝබර් මස 5 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් තාවකාලිකව වැඩ බැලීමට.

අංක : 74/2/37 (ඇම් ඇෆ්ජ්).

පී. පෙරේරා මහතා, 1962 ඔක්තෝබර් මස 6 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මහා භාණ්ඩාගාරයේ සහකාර ආයතන පාලකයකු වශයෙන් වැඩ බැලීමට.

හ. ෂ අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ,
1962 ඔක්තෝබර් 30 වැනිද.

11-373

---

1962 අංක 458

උක්වත්තෙගේ රන්ජිත් විජේතුංග මහතා, කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ.

11-277

1962 අංක 459

තුප්පහි බාර්බට් ද සිල්වා මහතා, ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තුමා විසින් පත් කර තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ.

11-295

---

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය : ඇල් : 91

කෘ.ඉ.වා.හා වි/අමා. අංකය : ජේ. 258.

ඉඩම් පවරා ගැනීමේ පනතේ (460 වැනි අධිකාරයේ) 19 (1) වැනි වගන්තියේ විධිවිධාන යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමන්ගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරෙයිරා මහතා සහ පී. පීෆ්ලික්ස් ප්‍රනාන්දු මහතා 1962 නොවැම්බර් 1 වැනි දින සිට, අවුරුදු තුනක කාලයක් සඳහා, එහි සඳහන් වන පරිදි ඇපැල් නඩු විසඳීම පිණිස වූ විවේචන මණ්ඩලයේ තක්සේරු සාමාජිකයින් වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

සී. ජ. වල්පිට,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1962 නොවැම්බර් 3 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

11-524

---

ඇල්.ඩී.—බී. 129/47

අංක: සී. 13/49

### 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජඥව

61 වැනි වගන්තිය යටතේ ආඥව

1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජාඥවේ 61 වැනි වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ආඥවයි.

1962 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දීය.

නිශ්ශංක විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේක

ආංක 149 දරණ ආඥව

මෙහි උපලේඛනයෙහි I වැනි තීරයෙහි නිශ්චිත බලතල ඒ උපලේඛනයෙහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියාට, නිලධාරීන්ට මතු සඳහන් කොන්දේසිවලට යටත්ව මෙයින් පවරනු ලැබේ.

ඒ කොන්දේසි මෙසේය :—

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කළ හැකි උපදෙස් අනුව ඒ බලතල ක්‍රියාවේ යෙදවිය යුතුය.

(ආ) ආහාර කොමසාරිස් හා ආහාර සැපයීම් අධ්‍යක්ෂ හැර ඉන් අන්‍යවූ නිලධාරියකු විසින් මේ ආඥව යටතේ තමන් වෙත පැවරුණු යම් බලයක් යටතේ දෙන ලද තීරණයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවූ ඕනෑම තැනැත්තකුට ඒ තීරණයට විරුද්ධව ආහාර කොමසාරිස් හා ආහාර සැපයීම් අධ්‍යක්ෂ වෙත ආයාචනා කළ හැකිය.

(ඇ) දඬුවම් දීම සම්බන්ධයෙන් එබඳු නිලධාරියකුට පැවරී ඇති යම් බලයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පාවිච්චි කළ යුතු යයි ඒ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් අවස්ථාවකදී, ඒ නිලධාරියා ඒ අවස්ථාව සම්බන්ධයෙන් ඒ බලය ක්‍රියාවේ නොයෙදවිය යුතුය.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනා කිරීම සඳහා 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජාඥවේ 61 වැනි වගන්තියෙන් පැවරුණු අයිතිවාසිකම හීන කිරීමක් හෝ අන් ලෙසකින් ඒ අයිතිවාසිකම කෙරෙහි බලපෑමක් හෝ මේ ආඥවෙහි සඳහන් කිසිවකින් සිදුවෙතැයි නොසැලකිය යුතුය, නැතහොත් එලෙස තේරුම් නොගත යුතුය.

3. 1955 ඔක්තෝබර් මස 7 වැනි දින හා අංක 10,847 දරණ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 83 හා 1955 ඔක්තෝබර් මස 1 වැනි දින දරණ ආඥවෙහි සඳහන් කිසිවක් ගැන නොසලකා මේ ආඥව බල පැවැත්විය යුතුය.

4. 1958 අගෝස්තු මස 1 වැනි දින හා අංක 11,465 දරණ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 112 හා 1958 ජූලි මස 23 වැනි දින දරණ ආඥව මිළ පාලක දෙපාර්තමේන්තුව (ආහාර) සම්බන්ධයෙන් අදාළ වන පමණටත්, 1957 මැයි 24 වැනි දින හා අංක 11,119 දරණ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ, අනතුරුව සංශෝධිත අංක 94 හා 1957 මැයි 16 වැනි දින දරණ ආඥවත් මෙයින් අවලංගු කරනු ලැබේ.

## උපලේඛනය

| I | II |
|---|---|
| 1. ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවෙහි ඇති ආරම්භක වාර්ෂික වැටුප රු. 4,080ට අඩු මෙහි පහත දැක්වෙන (ස්ථිර හෝ තාවකාලික වුවද) තනතුරු සඳහා පත්වීම් දීමේ බලය :—<br>(අ) සහකාර ආහාර පාලක<br>නීති සහකාර<br>නිවාරණ නිලධාරීහු I ශ්‍රේණිය<br>නිවාරණ නිලධාරීහු II ශ්‍රේණිය<br>ප්‍රවාහණ අධිකාරි<br>ප්‍රවාහණ නිලධාරි<br>සහකාර ප්‍රවාහණ නිලධාරි<br>වාප්පු සහකාරයෝ<br>ආහාර හා මිළ පාලක පරීක්ෂකවරු<br>ධාන්‍ය සමීක්ෂක<br>පරිපාලක<br>විමර්ශන නිලධාරි<br>ආහාර ද්‍රව්‍ය පරීක්ෂක<br>ගබඩා භාරකරුවෝ<br>සහකාර ගබඩා භාරකරුවෝ<br>ගබඩා සහකාර (තාවකාලික)<br>සහකාර සරප්වරු (තාවකාලික)<br>ලඝු ලේඛකවරු (තාවකාලික)<br>ටයිප්කරුවෝ (තාවකාලික)<br>ටැලිපෝන් ඔපරේටර්වරු<br>වැඩ පරීක්ෂක (තාවකාලික)<br>ප්‍රධාන වැඩපොළ ෆෝර්මන්<br>චාර්මස් ධාන්‍යාගාරයේ නිවාරණ නිලධාරි | ආහාර කොමසාරිස් හා ආහාර සැපයීම් අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර සැපයීම් අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර කොමසාරිස්වරු<br>නියෝජ්‍ය ආහාර පාලකවරු |
| (ආ) ලිපිකරුවෝ (තාවකාලික)<br>සැසඳුම් ලිපිකරුවෝ (තාවකාලික)<br>ලේඛන ලිපිකරුවෝ (තාවකාලික)<br>ප්‍රධාන ෆෝර්මන්<br>සහකාර ෆෝර්මන්<br>මුර ෆෝර්මන්<br>යාන්ත්‍රික ෆෝර්මන්<br>දෙරටු සෝදිසිකරු<br>පොත් බඳින්නෝ<br>මිකැනික්වරු<br>සහකාර මිකැනික්වරු<br>මෝටර්රථ රියැදුරෝ<br>රියැදුරෝ<br>ක්ලීනර්වරු<br>බෙලෙක් වැඩකරු<br>කම්මල්කරුවෝ<br>වඩුවෝ<br>විදුලි ශිල්පීහු<br>කසළ ශෝධක කංකානම<br>කසළ ශෝධක කම්කරුවෝ<br>උද්‍යාන කම්කරුවෝ<br>කම්කරුවෝ<br>මේට්‍රන්<br>මුරකරුවෝ<br>කාර්යාල කාර්ය සහායකයෝ<br>බයිසිකල් ඔඩර්ලිවරු<br>ගුදම් පරිපාලක (තාවකාලික)<br>ධූමායන යන්ත්‍ර ඔපරේටර්<br>කම්කරුවෝ (තාවකාලික) | ආහාර කොමසාරිස් හා ආහාර සැපයීම් අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර සැපයීම් අධ්‍යක්ෂවරයා<br>නියෝජ්‍ය ආහාර කොමසාරිස්වරු<br>නියෝජ්‍ය ආහාර පාලකවරු<br>සහකාර ආහාර පාලකවරු<br>කාර්යාල සහකාර |
| 2. ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවේ ඇති මෙහි පහත දැක්වෙන තනතුරක් දරණ අයට තරවටු කිරීමේ, දැඩිලෙස තරවටු කිරීමේ නැතහොත් සතියක වැටුපට නොවැඩි දඩයක් පැනවීමේ බලය :—<br>සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් හා සාමාන්‍ය ලිපිකරු පන්තියේ නිලධාරීහු<br>අර්ධ ලිපිකාර සේවයේ නිලධාරීහු<br>භාෂා පරිවර්තකවරු—II වැනි ශ්‍රේණිය<br>ලිපිකරුවෝ (තාවකාලික)<br>සැසඳුම් ලිපිකරුවෝ (තාවකාලික)<br>ලේඛන ලිපිකරුවෝ (තාවකාලික)<br>ගබඩා භාරකරුවෝ<br>සහකාර ගබඩා භාරකරුවෝ<br>ගබඩා සහකාර (තාවකාලික)<br>ටයිප්කරුවෝ<br>ටයිප්කරුවෝ (තාවකාලික)<br>ටැලිපෝන් ඔපරේටර්වරු<br>පොත් බඳින්නෝ<br>ප්‍රධාන ෆෝර්මන්<br>සහකාර ෆෝර්මන්<br>මුර ෆෝර්මන්<br>යාන්ත්‍රික ෆෝර්මන්<br>දෙරටු සෝදිසිකරුවෝ<br>මෝටර් රථ රියැදුරෝ<br>රියැදුරෝ | ආහාර කොමසාරිස් හා ආහාර සැපයීමේ අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර සැපයීම් අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර කොමසාරිස්වරු<br>නියෝජ්‍ය ආහාර පාලකවරු<br>ප්‍රධාන ගණකාධිකාරි<br>ගණකාධිකාරිවරු<br>සහකාර ආහාර පාලකවරු<br>කාර්යාල සහකාර |

| | |
|---|---|
| ක්ලීනර්වරු<br>මිකැනික්වරු<br>සහකාර මිකැනික්වරු<br>කාර්යාල කාර්ය සහායකයෝ<br>කාර්යාල කාර්ය සහායකයෝ (තාවකාලික)<br>බයිසිකල් ඕඩර්ලිවරු<br>බෙලෙක් වැඩකරු<br>වඩුවෝ<br>ධූමායන යන්ත්‍ර ඔපරේටර්<br>කම්මල්කරුවෝ<br>විදුලි ශිල්පීහු<br>කසළ ශෝධක කංකානම<br>කසළ ශෝධක කම්කරුවෝ<br>උද්‍යාන කම්කරුවෝ<br>කම්කරුවෝ<br>කම්කරුවෝ (තාවකාලික)<br>මේට්‍රන්<br>මුරකරුවෝ<br>මුරකරුවෝ (තාවකාලික)<br>ලඝු ලේඛකයෝ<br>ලඝු ලේඛකයෝ (තාවකාලික)<br>සරප්වරු<br>සහකාර සරප්වරු (තාවකාලික) | ආහාර කොමසාරිස් හා ආහාර සැපයීමේ අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර සැපයීමේ අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර කොමසාරිස්වරු<br>නියෝජ්‍ය ආහාර පාලකවරු<br>ප්‍රධාන ගණකාධිකාරි<br>ගණකාධිකාරිවරු<br>සහකාර ආහාර පාලකවරු<br>කාර්යාල සහකාර |

3. ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවෙහි ඇති වාර්ෂික පඩිනඩි රු. 2,700ට නොවැඩි විශ්‍රාම වැටුප් සහිත වූ, හෝ වාර්ෂික පඩිනඩි රු. 3,180ට නොවැඩි, විශ්‍රාම වැටුප් රහිත වූ හෝ වාර්ෂික පඩිනඩි රු. 3,180ට නොවැඩි, මාසික වැටුප් සහිත, තාවකාලික වූ හෝ මෙහි පහත දැක්වෙන තනතුරු දරන නිලධාරීන් අධිකරණයෙන් වරදකරුවන් වීමේ හේතුව හැර ඉන් අන්‍ය වූ හේතුවක් පිට තනතුරෙන් පහ කිරීමට හෝ ඒ නිලධාරීන්ට තරවටු කිරීමට නැතහොත් දැඩි ලෙස තරවටු කිරීමට හෝ සතියක වැටුපට නොවැඩි දඩයක් පනවා දඬුවම් කිරීමට හෝ වර්ෂයකට නොවැඩි කාලයක් පඩි වැඩිවීම් තාවකාලිකව අත් හිටවීමේ, නැවැත්වීමේ, අඩු කිරීමේ නැතහොත් පමා කිරීමේ බලය :—

| | |
|---|---|
| නිවාරණ නිලධාරීහු—I ශ්‍රේණිය<br>නිවාරණ නිලධාරීහු—II ශ්‍රේණිය<br>ප්‍රවාහණ නිලධාරි<br>සහකාර ප්‍රවාහණ නිලධාරි<br>චාප්පු සහකාරයෝ<br>ප්‍රධාන වැඩපොළ ෆෝර්මන්<br>ආහාර හා මිළ පාලක පරීක්ෂකවරු<br>විමර්ශන නිලධාරි<br>ධාන්‍ය සමීක්ෂක<br>පරිපාලක<br>ආහාර ද්‍රව්‍ය පරීක්ෂක<br>ගබඩා භාරකරුවෝ<br>සහකාර ගබඩා භාරකරුවෝ<br>ගබඩා සහකාර (තාවකාලික)<br>සහකාර සරප්වරු (තාවකාලික)<br>ලඝු ලේඛකයෝ (තාවකාලික)<br>ලිපිකරුවෝ (තාවකාලික)<br>සැසඳුම් ලිපිකරුවෝ (තාවකාලික)<br>ලේඛන ලිපිකරුවෝ (තාවකාලික)<br>ටයිප්ගසන්නෝ (තාවකාලික)<br>ටැලිපෝන් ඔපරේටර්වරු<br>ප්‍රධාන ෆෝර්මන්<br>සහකාර ෆෝර්මන්<br>මුර ෆෝර්මන්<br>යාන්ත්‍රික ෆෝර්මන්<br>දෙරටු සෝදිසිකරුවෝ<br>පොත් බඳින්නෝ<br>මිකැනික්වරු<br>සහකාර මිකැනික්වරු<br>මෝටර් රථ රියැදුරෝ<br>රියැදුරෝ<br>ක්ලීනර්වරු<br>බෙලෙක් වැඩකරු<br>කම්මල්කරුවෝ<br>වඩුවෝ<br>විදුලි ශිල්පීහු<br>කසළ ශෝධක කංකාන්ම<br>කසළ ශෝධක කම්කරුවෝ<br>උද්‍යාන කම්කරුවෝ<br>කම්කරුවෝ<br>කම්කරුවෝ (තාවකාලික)<br>මේට්‍රන්<br>මුරකරුවෝ<br>මුරකරුවෝ (තාවකාලික)<br>කාර්යාල කාර්ය සහායකයෝ<br>කාර්යාල කාර්ය සහායකයෝ (තාවකාලික)<br>බයිසිකල් ඕඩර්ලිවරු<br>ධූමායන යන්ත්‍ර ඔපරේටර්<br>ගුදම් පරිපාලක (තාවකාලික) | ආහාර කොමසාරිස් හා ආහාර සැපයීම් අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර සැපයීම් අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර කොමසාරිස්වරු<br>නියෝජ්‍ය ආහාර පාලකවර |

4. ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවෙහි ඇති වාර්ෂික පඩිනඩි රු 2,700ට වැඩි එහෙත් පවුම් 690 ට හෝ රු. 9,360 ට නොවැඩි, විශ්‍රාම වැටුප් සහිත වූ හෝ වාර්ෂික පඩි නඩි රු 3,180 ට වැඩි එහෙත් පවුම් 690 ට හෝ රු 9,360 ට නොවැඩි, විශ්‍රාම වැටුප් රහිත වූ හෝ වාර්ෂික පඩි නඩි රු. 3,180 ට වැඩි එහෙත් පවුම් 690 ට හෝ රු. 9,360 ට නොවැඩි මාසික වැටුප් සහිත තාවකාලික වූ හෝ මෙහි පහත දක්වෙන තනතුරු දරන නිලධාරින්ට තරවටු කිරීමේ නැතහොත් දැඩි සේ තරවටු කිරීමේ හෝ සතියක වැටුපට නොවැඩි දඩයක් පනවා දඩු වම් කිරීමේ හෝ පඩි වැඩිවීම වර්ෂයකට නොවැඩි කාලයක් තාවකාලිකව අත් හිටවීමේ, නැවැත්වීමේ, අඩු කිරීමේ හෝ සමා කිරීමේ බලය :—

| | |
|---|---|
| සහකාර ආහාර පාලකවරු<br>නීති සහකාර<br>ධාන්‍ය සමීක්ෂක<br>විමර්ශන නිලධාරි<br>ප්‍රවාහණ අධිකාරි<br>ප්‍රවාහණ නිලධාරි<br>ප්‍රධාන වැඩපොළ ෆෝර්මන්<br>සහකාර ප්‍රවාහණ නිලධාරි<br>වැඩ පරීක්ෂක (තාවකාලික)<br>වාප්පු සහකාරයෝ<br>ආහාර ද්‍රව්‍ය පරීක්ෂක<br>භාෂා පරිවර්තකවරු—II වැනි ශ්‍රෙණිය<br>වාමස් ධාන්‍යාගාරයේ නිවාරණ නිලධාරි<br>ආහාර හා මිළ පාලන පරීක්ෂකවරු | ආහාර කොමසාරිස් හා ආහාර සැපයීමේ අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර සැපයීමේ අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය ආහාර කොමසාරිස්වරු<br>නියෝජ්‍ය ආහාර පාලකවරු |

11–498

---

අංකය: පීආර්/ඒඑජ්/19

## ගැසට් නිවේදනය

ජී. වී. බුකානන් මහතා ලංකාවට පෙරලා පැමිණි බවත්, කොන් සල් කාය්‍යාලය භාරව සිටි කේ. සිවප්‍රගාසම් මහතාව එම ධුරයෙන් නිදහස් කොට කොළඹ, පේරුවේ නිර්වේතනික කොන් සල් වශයෙන් 1962 ඔක් තෝබර් මස 29 වෙනි දින සිට වැඩ කටයුතු භාරගත් බවත් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙමි.

ඇන්. කෘෂ්. දියෙස්,
රාජ්‍ය ආරක් ෂක හා විදේ ශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේ කම්.

1962 නොවැම්බර් මස 1 දින,
කොළඹ දී ය.

11-426

---

## ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත්‍ර ආඥපනත

(420 වැනි අධිකාරය වන) ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත්‍ර ආඥපනතේ 4 වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල පරිදි මුදල් ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1962 අංක 30 දරන විසර්ජන පනතින් ණය මාර්ගයෙන් ගැනීමට බලය පවරන ලද රුපියල් පණස් කෝටියෙන් මෙහි පහත උප ලේඛනයෙහි නියමිත මුදල, එම උපලේඛනයේ සඳහන් ක්‍රමය, නියමයන් හා කොන්දේසි අනුව ලංකාව ඇතුළත ණයට ගැනීමට මේ ආඥවෙන් නියම කරමි.

1962 නොවැම්බර් 5 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
මුදල් ඇමති,

### උපලේඛනය

1. ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ලබාගත යුතු වූ මුදල රුපියල් දෙකෝටි පණස් ලක්ෂයකි. මෙය මෙසේ ලබාගත යුතුය :—
   (අ) අවුරුදු 5–7 ණයක් සම මිලට නිකුත් කිරීමෙන්.
   (ආ) අවුරුදු 21–25 ණයක් සම මිලට නිකුත් කිරීමෙන්.

2. ණය මුදල් දෙකෙන් එක් එක් ණය මුදල, ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු ඇති කොට නිකුත් කිරීමෙන් පමණක් ලබා ගත යුතුය.

3. ගෙවිය යුතු පොළී ප්‍රමාණය :—
   (අ) අවුරුදු 5–7 ණය සඳහා අවුරුද්දකට සියයට $3\frac{1}{2}$ කි.
   (ආ) අවුරුදු 21–25 ණය සඳහා අවුරුද්දකට සියයට $4\frac{1}{4}$ කි.

4. එක් එක් ණය මුදල සඳහා සෑම වර්ෂයකම අර්ධ වාර්ෂික පොළිය මැයි 15 වැනි සහ නොවැම්බර් 15 වැනි දින වල ගෙවිය යුතුය.

5. ණය බේරීම සඳහා ණය මුදල් දෙකෙන් එක් එක් ණය මුදල බේරීම සඳහා පිහිටුවන නිදන් අරමුදලට—
   (අ) අවුරුදු 5–7 ණය සඳහා සියයට 5ක මුදලක්ද,
   (ආ) අවුරුදු 21–25 ණය සඳහා සියයට 3 ක මුදලක්ද,

   ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. මේ ගෙවීම 1963 නොවැම්බර් 15 වැනි දින ආරම්භ විය යුතුය.

6. ව්‍යාපාර වස්තු නිදහස් කිරීමේ දිනය :—
   (අ) 5–7 අවුරුදු ණය සඳහා 1969 නොවැම්බර් 15 වැනි දින විය යුතුයි.
   (ආ) 21–25 අවුරුදු ණය සඳහා 1987 නොවැම්බර් 15 වැනි දින විය යුතුයි.

   එසේ වුවද, ව්‍යාපාර වස්තු පහත දක්වෙන දිනයන්හිදී සම මිලට නිදහස් කිරීමේ කැමැත්ත රජයට තිබිය යුතුය :—
   (අ) 5–7 අවුරුදු ණය සඳහා 1967 නොවැම්බර් 14 වැනිදයින් පසු ඕනෑම දිනයක.
   (ආ) 21–25 අවුරුදු ණය සඳහා 1983 නොවැම්බර් 14 වැනිදයින් පසු ඕනෑම දිනයක.

මෙසේ මුදල් ආපසු ගෙවීමේ දිනය, මුදල් ඇමතිවරයා විසින් නියම කෙරෙන අතර, එම දිනයට හය මාසයකට නොඅඩු කාලයකට පෙර ඒ බව ගැසට් පත්‍රයේ හා යටත් පිරිසෙයින් ලංකාවේ පළවන පුවත් පත් දෙකක දැන්වීම් මාර්ගයෙන් ප්‍රසිද්ධ කළ යුතුය.

## කාර්ය විස්තර පත්‍රිකාව

ව්‍යාපාර වස්තූන් සඳහා මුදල් භාර ගැනීමේ ලැයිස්තු 1962 නොවැම්බර 15 වැනි දින විවෘත කොට 1962 දෙසැම්බර් 15 වැනි දින වසා දමනු ලැබේ. මුළු ණය මුදල ඊට පළමුව ලබා ගතහොත්, එම දිනයෙහිම මුදල් ලැයිස්තු වසා දමනු ලැබේ.

## ලංකාණ්ඩුවේ ණය

**ලබා ගන්නා ණය ප්‍රමාණය—රුපියල් 2,50,00,000 කි.**

3½% 1967–69 ණය මුදල " ආ " කාණ්ඩය—සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවනු ලැබේ.

4¼% 1983–87 ණය මුදල " උ " කාණ්ඩය—සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවනු ලැබේ.

ලංකාණ්ඩුව වෙනුවෙන් පහත දක්වෙන ණය මුදල් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

(අ) 1969 නොවැම්බර් 15 වැනි දින ආපසු ගෙවනු ලබන සියයට 3½ ණය—එහෙත් මෙම ණය 1967 නොවැම්බර් 14 වැනිදට පසුව සමසක දැනුම් දීමකින් පසු ඕනෑම දිනයක ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ.

(ආ) 1987 නොවැම්බර් 15 වැනි දින ආපසු ගෙවනු ලබන සියයට 4¼ ණය—එහෙත් මෙම ණය 1983 නොවැම්බර් 14 වැනිදට පසුව සමසක දැනුම් දීමකින් පසු ඕනෑම දිනයක ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ.

ලබාගන්නා මුළු ණය ප්‍රමාණය රුපියල් 2,50,00,000 නොඉක්මවන අතර, මේ එක් එක් ණය යටතේ කුමන ප්‍රමාණයන් ලබාගන්නේදැයි නියමිත නැත

**ණය ලබා ගැනීමේ බලය.**—ණය මුදල ලබා ගන්නේ 1962 අංක 30 දරණ විසර්ජන පනතින් ලත් බලයෙන් හා ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත් ආඥා පනතේ (420 වැනි පරිච්ඡේදය) අඩංගු නීති යටතේය.

**අරමුණ.**—රජය විසින් මේ ණය මුදල ලබාගනුයේ 1962 අංක 30 දරණ විසර්ජන පනතේ 2(1) (බී) වගන්තිය යටතේ 1962–63 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා වැය කරණු පිණිසය.

**නිකුත් කරන පිළිවෙළ.**—ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකිය).

**ණය කොටසක මිල.**—ණය කොටසක මිල රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල ඉල්ලුම් පත් ඉදිරිපත් කරන විට ගෙවිය යුතුය. අඩුම කොටස රුපියල් සියයකි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් 1962 නොවැම්බර් 15 වැනිද සිට ණය මුදල් ලබා ගන්නා ලැයිස්තු පියවනතුරු, රාජ්‍ය ණය රෙජිස්ට්‍රාර් තැන විසින් භාර ගනු ලැබේ. ණයට මුදල් දීමේ ඉල්ලීම් නියමිත ඉල්ලුම් පත්‍රිකාවල එවිය යුතු අතර, ඊට ගෙවිය යුතු මුළු මුදල ඒ සමග එවිය යුතුය. ලංකා මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කරන්නන්ට ඒ ආයතන සමග කටයුතු පිළියෙළ කොට ඒවා මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකිය.

බැංකුවලට ද (මුදල් ඉතිරිකිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුව ඇතුලු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට හා අවසර ලත් තැරැව්කරුවන්ටද, ඔවුන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට 1/16ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ. හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත්වල භාර ගත් ණය මුදල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයේම කොමිස් ගෙවනු ලැබේ.

**ව්‍යාපාර වස්තු සඳහා ගෙවීම.**—මුදල් ගෙවිය යුත්තේ :—

(අ) " ලංකාණ්ඩුවේ ණය අරමුදල " යනුවෙන් හරස් රේඛිත කොට මහ බැංකුව වෙත ගෙවීමට අණ කැරෙන චෙක් පතකින් සහ/හෝ

(ආ) 1962, නොවැම්බර් 15 වෙනි දින ආපසු ගෙවීමට නියමිත ලංකාණ්ඩුවේ 1957–62 සියයට 3½ ණය මුදලෙහි කොටස් ආපසු පවරා දීමෙනි. (වැඩි විස්තර පහත දක්වේ)

**ලංකාණ්ඩුවේ 1957–62 සියයට 3½ ණය මුදලෙහි කොටස් පවරාදීමෙන් ගෙවීම**–ඉහත සඳහන් ණය මුදල්හි කොටස් මිලදී ගැනීම සඳහා ලංකාණ්ඩුවේ 1957–62 සියයට 3½ ණය මුදලෙහි කොටස් බාර දීමේදී, විධිමත් ලෙස පිටසන් කැරුණු උචිත ව්‍යාපාර වස්තු සහතිකයද, ණය හිමියා විසින් සම්පූර්ණ කැරුණු ආපසු ගෙවීමේ බලපත්‍රයද, ඉල්ලුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය. ඉල්ලුම් පත පිළිගැනීමෙන් පසු ලංකාණ්ඩුවේ 1957–62 සියයට 3½ ණය මුදලෙහි රු. 100 නාමික වටිනාකම් ඇති එක් එක් ව්‍යාපාර වස්තුව වෙනුවට ඉහත සඳහන් ණය මුදල්හි රු. 100 ව්‍යාපාර වස්තුව බැගින් අයදුම්කරුගේ නමට නිකුත් කරනු ලැබේ.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම් පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව මැයි 15 වැනිද හා නොවැම්බර් 15 වැනිද නියමිත ප්‍රමාණයන් අනුව පොළී ගෙවනු ලැබේ. පළමුවෙන් පොළී ගෙවන්නේ 1963 මැයි 15 වැනිදය. ඒ පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1963 මැයි 14 වැනිද තෙක්, ඒ දිනයද ඇතුලත් වන කාල සීමාව සඳහාය.

**අයබදු ගැනීම.**—**(i)** මුද්දර ගාස්තු :—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේ දී පාවිච්චි කරන සෑම ලියවිල්ලක්ම මුද්දර ගාස්තුවලින් නිදහස්ය.

**(ii)** ආදායම් බදු :—ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදායම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත්, ආදායම් බද්දට යටත්වන ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදායම් බදු සඳහා තමාගේ ආදායම් පෙන්වීමේ දී එම පොළිය ද අඩංගු කළ යුතුය. ලංකාවේ පදිංචි නොවූවන්ට පොළී ගෙවීමට පෙර ආදායම් බදු අඩු කර පොළී ගෙවනු ලැබේ. (දැනට ආදායම් බදු ප්‍රමාණය, ලංකාවේ පදිංචි නොවූ පුද්ගලයන්ගෙන් සියයට 33⅓ක් ද, ධනය ඒකාබද්ධ වූ හින්දු පවුල්වලින් සියයට 39⅓ක් ද, පිට රට ලියා පදිංචි කළ සමාගම්වලින් සියයට 62½ක් ද වෙයි.) ලංකා ආදායම් බද්දෙන් නිදහස් අයට, අය කරනු ලැබූ ආදායම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

**(iii)** ධන බද්ද :—1959යේ අංක 14 දරණ පුද්ගලික බදු පනතේ 6(1) (ජී) වගන්තිය යටතේ ලංකාණ්ඩුවේ ණය පත්හි යොදන මුදල පුද්ගලයෙකුගේ, ධනය වශයෙන් සලකනු නොලැබේ. එබැවින් ඒවා ධන බද්දෙන් නිදහස්ය.

**(iv)** බූදල් බද්ද :—ලංකාණ්ඩුව විසින් නියම කෙරෙනු ලබන යම් යම් ව්‍යාපාර වස්තූන් වේද, ඒවා බූදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. සම්පූර්ණ මුදල ගෙවූ සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවන ව්‍යාපාර වස්තූන්ගේ නාමික මිලත්, එයින් රැස්වන පොළියත්, ඒ සමාන බූදල් බද්දක් ගෙවීමට යෙදිය හැක. සම්පූර්ණ මුදල නොගෙවූ හෝ අඩු මිලට නිකුත් කළ හෝ සම මිලට නොව වෙනයම් මිලකට ආපසු ගෙවන හෝ ව්‍යාපාර වස්තූන් සඳහා රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකිනුත්, එයින් උපදින පොළියෙනුත් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය වරින්වර ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවේ. නමුත් එවැනි රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකින් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය, මුලින් ව්‍යාපාර වස්තුව නිකුත් කරන අවස්ථාවේදී ගෙවූ මුදලත්, ව්‍යාපාර වස්තුව ආපසු ගෙවීමේ දී ගෙවෙන මුදලත් යන දෙකෙහි අඩු මුදල යමක් වේ ද, එයට නොඅඩු මුදලක් වේ. මුදලින් බූදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම කළ හැක්කේ එම ව්‍යාපාර වස්තූන් මුලින් නිකුත් කරන අවස්ථාවේදීම මියගිය තැනැත්තා විසින් මිලයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නොඅඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තූන් මිලයට ගෙන තිබේ නම් හෝ පමණකි.

**සුරක්ෂිතතාවය.**—ණය මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ආරක්ෂාවී ඇත. ණය ගෙවීමේ අරමුදල්හි භාරකරුවන් වන මහ බැංකුවේ මුදල් මණ්ඩලය එහි පාලනය යටතේ ණය මුදල් බේරීම සඳහා එක් එක් ණයමුදල සඳහා වෙන් වෙන්වූ නිදන් අරමුදලක් පිහිටුවනු ඇත. පහත දක්වෙන දිනයන්හිදී එහි දක්වෙන ප්‍රමාණයන් අනුව නිදන් අරමුදල් දෙකට අර්ධවාර්ෂික ගෙවීම් පටන්ගනු ලැබේ :—

(අ) 3½% 1967–69 " ආ " කාණ්ඩය ණය මුදල සඳහා : වර්ෂයකට සියයට 5හේ ප්‍රමාණය අනුව 1963 නොවැම්බර් 15 වැනි දින සිට,

(ආ) 4¼% 1983–87 " උ " කාණ්ඩය ණය මුදල සඳහා : වර්ෂයකට සියයට 3නේ ප්‍රමාණය අනුව 1963 නොවැම්බර් 15 වැනි දින සිට.

**ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.**—දනට ලංකාණ්ඩුවේ දළ සදතන ණය ප්‍රමාණය රු. 1,89,31,67,245කි. ණය බේරීම සඳහා වෙන්වූ නිදන් අරමුදලෙහි ආසන්න වෙළෙඳ වටිනාකම රු. 35,43,70,044කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 1,53,87,97,201කි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන්, වාණිජ බැංකුවලින්, කච්චේරිවලින්, තැපැල් කාර්යාලවලින් හෝ ජාතික මුදල් ඉතිරි කිරීමේ ව්‍යාපාරයේ කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ද ලබා ගත හැකිය.

ඕ. බී. ගුණවර්ධන,
රාජ්‍ය ණය රෙජිස්ට්‍රාර් තැන.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහාබැංකුව,
තැ. පෙ. 1149,
කොළඹ 1,
1962 නොවැම්බර් 9 වැනි දින දීය.

---

## දැන්වීමයි

කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් සිසිල් ඇල්f්‍රඩ් සිඩ්නි ඉයුස්ටස් ක්‍රිස්පින් මහතා විසින් නොතාරිස් වරුන් පිළිබඳ (පරිච්ඡේද අංක 107 දරණ) ආඥපණතේ 22(1) වගන්තිය යටතේ 1962ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, කම්කාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ක්වූ ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දීය.

11-276

---

ඇල් ඩී.—බී 47/41.

## සූතිකාධාර ආඥපනත

කම්කරු හා ජනසතු සේවා ඇමතිවරයා විසින් වර්ෂ 1958 අංක 6 දරන පනතින් සංශෝධිත (140 වන අධිකාරය වන) සූතිකාධාර ආඥපනතේ 15 වන වගන්තිය යටතේ කරන ලද, උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය මගින් අනුමත කරනු ලැබූ, රෙගුලාසියයි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා ඇමති.

1962 ඔක්තෝබර් මස 31 දින,
කොළඹ දීය.

## රෙගුලාසිය

වර්ෂ 1946 නොවැම්බර් මස 22 වන දින අංක 9,634 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලදුව, වර්ෂ 1957 ජනවාරි මස 11 වන දින අංක 11,046 දරණ ගැසට් පත්‍රයේ පළවූ රෙගුලාසියෙන් සංශෝධනය කළා වූ ද (140 වන අධිකාරය වන) සූතිකාධාර ආඥපනතේ 15 වන වගන්තිය යටතේ කරන ලද රෙගුලාසි, මෙයින් තවදුරටත් පහත සඳහන් ලෙස සංශෝධනය කරනු ලැබේ :—

(1) 8 වන නියෝගයට පසුව පහත දක්වෙන අළුත් නියෝගය යෙදීමෙන් :—

"8අ, කර්මාන්තශාලාවක් නොවන එහෙත් පස් දෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු හෝ සේවයෙහි යොදවාගෙන ඇති සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් ඉංජිනේරු කර්මාන්තයෙහි හෝ ගොඩනැගිලි කර්මාන්තයෙහි නියුක්ත, යම්කිසි ආයතනයක් මෙම ආඥපනතේ උවමනාවන් සඳහා නියමිත ආයතනයක් වන්නේ ය."; සහ

(2) 9 වන නියෝගයේ "දැන්වීම් පොත" යන්නෙහි අර්ථ නිරූපනයට වහා ඉදිරියෙන් පහත සඳහන් අළුත් නිරූපනයන් යෙදීමෙන් :—

" "ගොඩනැගිලි කර්මාන්තය" යන්නෙන් (136 වන අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 6 වන වගන්තිය යටතේ කරන ලදුව වර්ෂ 1949 දෙසැම්බර් මස 16 වන දින අංක 10,054 දරණ ගැසට් පත්‍රයේ පළ වූ (පසුව සංශෝධනය කළ) නියමයෙහි දක්වෙන අර්ථයම ගැනෙයි;

"ඉංජිනේරු කර්මාන්තය" යන්නෙන් (136 වන අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 6 වන වගන්තිය යටතේ කරන ලදුව වර්ෂ 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරණ ගැසට් පත්‍රයේ පළවූ (පසුව සංශෝධනය කළ) නියමයෙහි දක්වෙන අර්ථයම ගැනෙයි."

11-393

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ඔක්තෝබර් මස 23 වන දින,
කොළඹ 2.

### උපලේඛනය

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරලේ ආදායම් නිලධාරී කොට්ඨාශයේ කෑගල්ල ගම්මුලාදැනි වසමේ පිහිටි බොකුඹුරේ වත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 10 ක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : ගනේගොඩ පාර; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : කෝපියාවත්ත කුඹුර.

11-270

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ඔක්තෝබර් මස 23 වන දින,
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත් කුරු කෝරලය ආදායම් නිලධාරී කොට්ඨාශයේ අංක 200/201 දරණ තැම්පල ගම්මුලාදැනි වසමේ පිහිටි තැම්පල වත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අ. 2, රූ. 1, ප. 28 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ඩබ්ලිව්. ජුවානිස් රූද්‍රිගුට සහ ජී. සෙලෙස්තීනු සිල්වාගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම් ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස සහ ඩබ්ලිව්. ආරොන් රූද්‍රිගුට අයිති ඉඩම ; බස්නාහිරට : දෙවට පාර සහ ජී. සෙලෙස්තීනු සිල්වාගේ උරුමක්කාරයින්ට අයිති ඉඩම.

11-269

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ඔක්තෝබර් මස 23 වන දින,
කොළඹ 2.

### උපලේඛනය

සබරගමුව පළාතේ, බෙලිගල් කෝරලය ආදායම් නිලධාරී කොට්ඨාශයේ කොබ්බෑවල වසම ගම්මුලාදෑනි වසමේ පිහිටි "මේපිල්ඩ් වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 1½ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : එම වත්ත කොටසක් වන කුඹුර; නැගෙනහිරට : එම වත්තේ කොටසක්; දකුණට : එම වත්තේ කොටසක්; බස්නාහිරට : ඇල.

11-268

---

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් අනුමත කරනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මවිසින් මෙයින් දැනුම් දෙමි.

වී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1962 ඔක්තෝබර් 29 දින,
කොළඹදී ය.

### උපලේඛනය

| දිනය | නියෝගය | නියෝගය නිකුත් කරන ලද ද්‍රව්‍ය | නියෝගය පළ කරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 10. 9.62 | පොළොන්නරු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය | 25. 9.62 වෙනි දින අංක 13,315 |
| 5.10.62 | මිළ (ආහාර) පාලක | එම | 5.10.62 වෙනි දින අංක 13,336 |
| 8.10.62 | සහකාර මිළ (ආහාර) පාලක, මන්නාරම දිස්ත්‍රික්කය | එම | 10.10.62 වෙනි දින අංක 13,341 |

11–328

---

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් අනුමත කරනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මවිසින් මෙයින් දැනුම් දෙමි.

වී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1962 ඔක්තෝබර් 29 වෙනි දින,
කොළඹදී ය.

### උපලේඛනය

| දිනය | නියෝගය | නියෝගය නිකුත් කරන ලද ද්‍රව්‍ය | නියෝගය පළ කරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 62. 8.21 | මිළ (ආහාර) පාලක | කරවල හා වියළි ඉස්සෝ | 62. 8.21 වෙනි දින අංක 13,270 |
| 62. 8.30 | එම | අතිරේක ආහාර ද්‍රව්‍ය | 62. 8.30 වෙනි දින අංක 13,278 |
| 62. 8. 1 | මහනුවර දිස්ත්‍රික්කයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට කොට්ඨාශයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | හරක් මස් | 62. 8. 7 වෙනි දින අංක 13,255 |
| 62. 8. 1 | එම | එළු මස් | එම |
| 62. 6.25 | එම | උම්බලකඩ හෝ බොනිටෝ පිෂ් | 62. 7.31 වෙනි දින අංක 13,236 |
| 62. 8.20 | සහකාර මිළ (ආහාර) පාලක, කුරුණෑගල දිස්ත්‍රික්කය | හරක් මස් | 62. 8.23 වෙනි දින අංක 13,271 |
| 62. 8.23 | සහකාර මිළ (ආහාර) පාලක, මාතර දිස්ත්‍රික්කය | කරවල හා වියළි ඉස්සෝ | 62. 9. 4 වෙනි දින අංක 13,291 |
| 62. 7.31 | සහකාර මිළ (ආහාර) පාලක, රත්නපුර දිස්ත්‍රික්කය | එම | 62. 7.31 වෙනි දින අංක 13,236 |
| 62. 6.27 | සහකාර මිළ (ආහාර) පාලක, පුත්තලම් දිස්ත්‍රික්කය | උම්බලකඩ හෝ බොනිටෝ පිෂ් | 62. 7. 2 වෙනි දින අංක 13,190 |

11–327

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 56/62 දරන ආනයන පාලන දැන්වීම

(1962 නොවැම්බර් 1 දින අංක 13,370 අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ මෙම දැන්වීමේ 3 ඡේදයේ (VIII) යටතේ සඳහන්) වෙළඳ ද්‍රව්‍ය ගණවල ලැයිස්තුව

**ඒ. ගණය**

(1) මස් (මීට්) සහ මස් (මීට්) වලින් පිළියෙල කළ ද්‍රව්‍ය
(2) ගව පට්ටි නිෂ්පාදන
(3) මාලු සහ මාලුවලින් පිළියෙල කළ ද්‍රව්‍ය
(4) අර්තාපල්
(5) මිරිස්
(6) ළූණු

**බී. ගණය**

(1) මද්‍යසාර සහිත බීම වර්ග
(2) දුම් කොළ (බීඩි දුම් කොළ සහ බීඩි හැර)

**සී. ගණය**

(1) දුව
(2) රෙදි වියන කෙඳි සහ ඉවත් ලන දෑ, රෙදි නූල් සහ නූල්
(3) සත්ව සහ ශාක දළ (කෘෘඩ්) ද්‍රව්‍ය
(4) සත්ව සහ ශාක තෙල්—සත්ව වැලෝ

**ඩී. ගණය**

(1) ඛනිජ ඉන්ධන සහ ස්නේහක සහ ඊට අදාල ද්‍රව්‍ය
(2) සෝර

**ඊ. ගණය**

(1) රසායනික මූල ද්‍රව්‍ය සහ සංයෝග
(2) සායම්, සම් පදම් කිරීමේ සහ පාට කිරීමේ ද්‍රව්‍ය (බිස්ටැම්පර්, වාර්නිස්, පින්තාරු තීන්ත සහ ඇනමල් ඇතුළත්ව)
(3) ඖෂධීය සහ භෛෂජ්‍ය නිෂ්පාදන
(4) සුවඳ ද්‍රව්‍ය, විලවුන්, ප්‍රසාදක නිෂ්පාදන
(5) ඉටි ජාති, පොලිෂ් ජාති, ලී සුරක් ෂණීය ලේප සහ ඊට සමාන නිෂ්පාදන

**ඈෆ්. ගණය**

(1) හම්වලින් කළ නිෂ්පාදන
 (ඒ) හම් පදම් කළ, ඩ්‍රෙස් කළ
 (බී) කර්මාන්තයේ පරිහරණය සඳහා වූ (කෘත්‍රිමයන් ද ඇතුළත්) හම් නිෂ්පාදන

(2) තේ සහ වෙනත් පෙට්ටි, ෂූක්—තුනී ලෑලි

(3) ලීයෙන් කළ නිෂ්පාදන (හාර්ඩ් බෝඩ් සහිත නමුදු ගෘහ භාණ්ඩ රහිත)

(4) පුවත්පත් කඩදාසි

(5) කඩදාසි, පුවත්පත් කඩදාසි හැර

(6) කඩදාසි, පල්පවලින් සෑදූ බඩු ජාති

(7) රබර් නිෂ්පාදන—ටයර සහ ටියුබ ඇතුළත්

**ජී. ගණය**

(1) රෙදිපිළි
 (ඒ) කපු fපැබ්රික් රෙදි
 (බී) කපු හැර fපැබ්රික් රෙදි
 (සී) තනන ලද පිළි බඩු ජාති (බිම අතුරන රෙදි හැර)

**එච්. ගණය**

(1) විද්‍යා, වෛද්‍ය, දෘෂ්ටි, මෙවලම්, උපකරණ සහ අඩුවැඩිය

(2) වෘත්තීය, විද්‍යාත්මක, මාණක සහ පාලනාත්මක මෙවලම්

(3) විද්‍යාත්මක වීදුරු බඩු

(4) දෘෂ්ටි වීදුරු, කණ්ණාඩි කාච ඇතුළත්ය

(5) ඡායා රූපීය සහ සිනමා චිත්‍ර පටි ශිල්පීය සැපයීම් (උපකරණ සහ අඩුවැඩිය හැර)

(6) සංගීත භාණ්ඩ, කතා යන්ත්‍ර සහ තැටි

(7) පොත්, පුවත්පත්, සහ වාර සඟරා

(8) ක්‍රීඩා භාණ්ඩ (රෙදි හැර)

**අයි. ගණය**

(1) මාර්ග මෝටර් වාහන සඳහා වූ අමතර කොටස් (චැසි, රාමු, බොඩි, ටයර සහ ටියුබ් හැර)

(2) මාර්ග මෝටර් වාහන සඳහා වූ උපාංග (ඇක්සෙසරීස්)

**ජේ. ගණය**

(1) යන්ත්‍ර—විදුලි හැර
 (ඒ) බල ජනක
 (බී) කෘෂිකාර්මික
 (සී) කාර්මික
 (ඩී) කාර්යාලයීය

(2) විදුලි යන්ත්‍ර (උපකරණ සහ අඩුවැඩිය හැර)

(3) විදුලි උපකරණ
 (ඒ) වියළි සැල් බැටරි—වයර්ලස්
 (බී) වියළි සැල් බැටරි, වෙනත්

(4) බල්බ සහ පොලරසන් ටියුබ

(5) විදුලිය සඳහා වූ ආවරණක කේබල සහ කම්බි

(6) වෙනත් විදුලි උපකරණ සහ අඩුවැඩිය (රේඩියෝවල් සහ පංකා)

**කේ. ගණය**

(1) ප්‍රිfපැබ්රිකේටඩ් ගොඩනැගිලි ද්‍රව්‍ය

(2) සනීපාරක්ෂක වැඩ්දුම්

(3) සිමෙන්ති

(4) අලෝහ ඛනිජ ගොඩනැගිලි ද්‍රව්‍ය (වහළ උළු සහිත)

(5) ෂීට්, තහඩු, වීදුරු

(6) බෝතල, පලස්කු සහ සාමාන්‍ය වීදුරුවෙන් කළ වෙනත් බඳුන්

**ඈල්. ගණය**

(1) මූලික ලෝහ—පවුඩර්, බ්ලොක්, ඉංගොට්, කේක්, ස්ලැබ්, බාර්, රොඩ්, ප්ලේට්, ෂීට්, වයර්, පයිප්ප, ටියුබ, කාස්ටිං සහ fෆෝර්ජිං ද ඇතුළත්ය

(2) යකඩ සහ වානේ

(3) වෙනත්—(තඹ, නිකල්, ඇලුමිනියම්, ඊයම්, තුත්තනාගම්, බෙලෙක් ඇතුළත්ය)

**ඈම්. ගණය—නිෂ්පාදිත ලෝහ—**

(1) යකඩ සහ වානේ (කේබල, කඹ, නිමහම් කළ ගොඩනැගිලි කොටස්, එක්ස්පැන්ඩන්ට් ලෝහ ඇතුළත්ය)

(2) හාර්ඩ්වෙයාර් බඩු (ඉබි යතුරු, ජනෙල් වැඩ්දුම් ආදිය)

(3) අගුලු, මුරිච්චි, වොෂර, මිටියම් ඇණ සහ ඉස්ටේපල

(4) කෘෂිකාර්මික ආම්පන්න සහ ආවුද

(5) වෙනත් ආම්පන්න සහ ආවුද

(6) තේ සහ වෙනත් පෙට්ටි හා ෂූක් සඳහා වූ ලෝහ වැඩ්දුම් (යකඩ සහ වානේ)

(7) ප්‍රවාහණය සහ ගබඩා කිරීම සඳහා වූ ලෝහ බඳුන්

(8) වෙනත් නිෂ්පාදන (නැමෙන නල, හෝස් පයිප්ප ඇඳුම්, තේ පෙනේර සහ පොලන)

(**සැලකිය යුතුයි.**—මෙම වෙළඳ ද්‍රව්‍ය විස්තරයට බොහෝ සේ පදනම්ව ඇත්තේ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය වේ. වෙළඳ ද්‍රව්‍ය මෙසේ ගණවලට බෙදෙනුයේ දෙපාර්තමේන්තුව සංවිධානය කිරීම පෙරදැරිවය.)

11-502

---

## වන සත්ව හා දුර්ලභ වෘක්ෂලතා ආඥා පනතේ 469 වැනි පරිච්ඡේදයේ 13 (1) දරණ වගන්තිය යටතේ කරන ප්‍රකාශනයයි

1962 අගෝස්තු 3 වන දින අංක 13,241 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනය හා සම්බන්ධයි.

අනුරාධපුර දිසාපති හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වන සත්ව භාරකරු වන උපාලි ආනන්ද ගුණරත්න නමැති මා, ඉහතින් සඳහන් කළ ප්‍රකාශනයේ දිනය 1962 නොවැම්බර් 30 වැනිදා දක්වා මෙයින් දීර්ඝ කරමි.

තවද, මෙම අලියාගෙන් අලාභ හානි සිදුවේයයි සැක කරන නැගෙනහිර නුවරගම් පළාතේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 17 දරණ ගම්මුලාදැනි කොටසේ මහකුඹුක්ගොල්ලෑව ගම ද, ඉහතින් සඳහන් ගැසට් ප්‍රකාශනයට ඇතුළත් කරන බවත්, එම ප්‍රදේශය ද අලින්ගෙන් පෑළුවන ප්‍රදේශයක් බව ප්‍රකාශ කරනු ලැබේ.

යූ. ඒ. ගුණරත්න,
අනුරාධපුර දිසාපති තැන සහ
දිස්ත්‍රික් වන සත්ව භාරකරු.

දිසාපති කායසීලය ය,
අනුරාධපුරය,
1962 ඔක්තෝබර් මස 25 වැනි දින දීය.

11-304

---

## අනුරාධපුර සමුපකාර කොට්ඨාශය නැවත බෙදා වෙන්කිරීම

අනුරාධපුර සමුපකාර කොට්ඨාශය, සමුපකාර කොට්ඨාශ දෙකක් වශයෙන් 1962.11.15 දින සිට බෙදා වෙන්කර ඇති බැව් මෙයින් දන්වනු ලැබේ.

පහත සඳහන් ආදායම් පාලක නිලධාරිවරුන්ගේ කොට්ඨාශ අනුරාධපුර දකුණු කොට්ඨාශයට ඇතුළත් වනවා ඇත :—

නුවරගම පළාත බටහිර
කලාගම් පළාත
හුරුළු පළාත දකුණ

පහත සඳහන් ආදායම් පාලක නිලධාරිවරුන්ගේ කොට්ඨාශ අනුරාධපුර උතුරු කොට්ඨාශයට ඇතුළත් වනවා ඇත :—

නුවරගම පළාත නැගෙනහිර
හුරුළු පළාත උතුර
උඩියන් කළම කෝරළේ
වව්නියා සිංහල කොට්ඨාශය

ටී. ඊ. ගුණරත්න,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර
සමිති රෙජිස්ත්‍රාර් තැන.

සමුපකාර දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 419,
කොළඹ, 1962 ඔක්තෝබර් 31.

11-406

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බින්තැන්න කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ බින්තැන්නේ ගම්පති කොට්ඨාශයේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1961. 1. 13 දින අංක 12,271 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලය,
පේරාදෙණිය,
1962 ඔක්තෝබර් 29 වැනි දින දීය.

11-300

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කන්දපහළ කෝරළේ ගවයින් අතර, "රක්තාශ්‍රව" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962. 8. 31 දින අංක 13,279 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලය,
පේරාදෙණිය,
1962 ඔක්තෝබර් 29 වැනි දින දීය.

11-301

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි